## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/242/2024 (NPC)

හේමාල් අසංක ඉදුනිල් හතුරුසිංහ
**අභියාචක**

**එදිරිව**

ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.30**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා පෙනී සිටී.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

### විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

අභියාචක එච්.ඒ.අයි.හතුරුසිංහ යන අය විසින් ඉදිරිපත් කර ඇති, 2024.11.06 දිනැති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහුට එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, ඔහු වරදකරු බවට පත්කර ඇති තීරණය සාවද්‍ය බවත්, ඒ අනුව ඔහු වෙත පනවා ඇති විනය දඬුවම ඉවත් කරමින් නියෝගයක් නිකුත් කරන ලෙසත්ය. ප්‍රවාහන හා සංදේශ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති විසින් නිකුත් කර ඇති, 2021.04.27 දිනැති ලිපිය මඟින්, අභියාචක වෙත චෝදනා දෙකක් ඉදිරිපත් කර ඇත. එකී චෝදනා දෙකට පදනම් වූ සිද්ධිය කුමක්ද යන්න එහි සඳහන්ව ඇත.

ඒ අනුව අභියාචක වෙත චෝදනා ඉදිරිපත් කිරීමට මුල් වී ඇතැයි කියනු ලබන්නේ, ඔහු කුරුදුවත්ත පොලිස් ස්ථානයේ තිබෙන විචාහක නිල

නිවසෙහි පදිංචිය පවත්වා ගෙන යන අතරතුරදී, ඊට යාබද නිල නිවසෙහි පදිංචිව සිටි පොලිස් කොස්තාපල් සමන් කුමාර යන අයගේ, වයස අවුරුදු පහක් පමණ වයසැති වූ විනුජි යෙහන්සා සහ වයස අවුරුදු එකහමාරක් පමණ වයසැති විනුකි උජේජා යන දියණියන් දෙදෙනා, අභියාචකගේ නිවසට පැමිණි අවස්ථාවේ දී, 2019.11.01 වන දින හෝ ඊට ආසන්න දින කිහිපයක දී බරපතල ලිංගික අපයෝජනයක් සිදුකර තිබුණාය යන කරුණයි.

මෙම සිද්ධියට අදාළව, අභියාචක පොලිස් අත් අඩංගුවට පත්ව තිබී ඇති අතර, ඔහුට විරුද්ධව කොළඹ මහාධිකරණයේ නඩු කටයුත්තක් ආරම්භ වී ඇත. එම නඩුව 2023.12.06 වෙනි දින විභාගයට ගත් අවස්ථාවේ දී පැමිණිල්ල වෙනුවෙන් කැඳවා ඇති 2, 3 සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කිරීමෙන් අනතුරුව නීතිපතිතුමා විසින් පැමිණිල්ල ඉදිරියට පවත්වා ගෙන නොයාමට තීරණය කර ඇති හෙයින්, අභියාචකට විරුද්ධව තිබූ චෝදනා වලින් ඔහුව මුදාහැර ඇත.

ඉහත කී මහාධිකරණ නඩුවේ දී ලිංගික අපයෝජනයට ලක්වූවා යැයි කියන ලද දරුවන් දෙදෙනා සාක්ෂියට කැඳවා නැත. එම දරුවන් දෙදෙනාගේ සාක්ෂි විධිමත් විනය පරීක්ෂණයේ දී ද සටහන් කරගෙන නැත. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා ඔහුගේ තීරණයට එළඹීමේ දී වැඩි බරක් දී ඇත්තේ, අපයෝජනයට ලක් වූවා යැයි කියනු ලබන දැරියන් දෙදෙනා සාක්ෂියට කැඳවා නොතිබීම යන කරුණටය.

එකී දැරියන් දෙදෙනාගෙන් වැඩිමහලු දැරිය අවුරුදු පහක කෙනෙකු බව සාක්ෂි වලින් හෙළිදරව් වී ඇත. එවැනි වයස් සීමාවක දරුවෙකුගේ සාක්ෂිය මත කිසියම් තීරණයකට එළඹීම සුදුසු ක්‍රියාවක් නොවේ. ඒ අනුව එම දරුවන් සාක්ෂියට නොකැඳවීම හේතුවක් ලෙස සළකා, අභියාචක චෝදනා වලින් නිදහස් කිරීමට ගෙන ඇති තීරණය නිවැරදි නොවේ.

විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් ව තිබූ අනිකුත් සාක්ෂි පිළිගත හැකිද යන කරුණට විශේෂ අවධානය යොමු කළ යුතුව තිබුණි. එකී විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා ඔහුගේ විනය පරීක්ෂණ වාර්තාවේ 05 වන පිටුවේ සඳහන් කර ඇත්තේ, වෛද්‍ය වාර්තා අනුවත්, ලැබුණු සාක්ෂි අනුවත්, වයස අවුරුදු 05ක් වයසැති විනුජි යෙහන්සා දැරිය කිසියම් ලිංගික අපයෝජනයකට ලක්ව සිටි බව සනාථවී ඇති බවයි. ඔහු විසින් එසේ සඳහන් කර තිබූ නමුත්, පරීක්ෂණ නිලධාරියා වැඩිදුරටත් සඳහන් කර

ඇත්තේ, අභියාචක විසින් ලිංගික අපචාරයක් කර තිබුණේ නම්, එම ක්‍රියාව පොලිස් සේවයේ හොඳ නමට කැළලක් විය නොහැකි බවයි.

වෛද්‍ය සාක්ෂි අනුව මෙම දැරිය ලිංගික අතවරයකට ලක්ව සිටි බව සනාථ ව තිබේ නම්, අභියාචක විසින්ම එම අපයෝජනය සිදුකර තිබුණේද යන්න පිළිබඳව සාක්ෂි තිබේදැයි යන්න පරීක්ෂණ නිලධාරියා විසින් සළකා බැලිය යුතුව තිබුණි.

විධිමත් විනය පරීක්ෂණ නිලධාරියා ඔහු විසින් ඉදිරිපත් කර ඇති ඉහත කී වාර්තාවේ 08 වන පිටුවේ මෙසේ සඳහන් කර ඇත.

> "***විනුපි යෙහන්සා දැරිය මෙම විධිමත් විනය පරීක්ෂණයේ සාක්ෂි ලබා නොදීම නිසා එම වරද චූදිත විසින් කළ බව ඍජු සාක්ෂි වලින් හෝ විද්‍යාත්මකව සනාථ නොවෙතත්, වෙනත් පරිවේෂණිය සාක්ෂි වලින් සනාථ වේ.***"

දැරියන් දෙදෙනා ලිංගික අපයෝජනයට ලක්වීම නිසා, ඔවුන් බියටත්, මානසික විෂාධියටත් පත්ව සිටින බවටද එම වාර්තාවේ සඳහන් කර ඇත. එම තත්ත්වය ඉහත කී වාර්තාවේ 10 වන පිටුවේ සඳහන් කර ඇත. මෙවැනි තත්ත්වයක් යටතේ අභියාචක විසින්ම මෙම වරද සිදුකළාද යන්න ඔප්පු කිරීම සඳහා පරිවේෂණ සාක්ෂි ඉදිරිපත් වී තිබිය යුතුය.

සිද්ධිය වූ දින අභියාචක, ඔහුගේ නිවසේ රැඳී සිටි බවට පැහැදිලි සාක්ෂි ඉදිරිපත් ව ඇත. දැරියන් දෙදෙනාගේ ප්‍රකාශයන් සටහන් කරගෙන තිබූ ප්‍රේමලතා නැමැති සාක්ෂිකාරිය, මෙම දැරියන් දෙදෙනා විසින් ඇයට කරන ලද ප්‍රකාශයන් මොනවාද යන්න සාක්ෂි මඟින් ඉදිරිපත් කර ඇත. එම සාක්ෂි මත ක්‍රියා කරමින්, කටයුතු කිරීම අපරාධ නඩුවකදී කළ නොහැකි බවට කරුණු ඉදිරිපත් කලත්, විධිමත් විනය පරීක්ෂණයකදී එවැන්නක් නොසළකා හැරිය නොහැකිය. දැරියන් දෙදෙනා විසින් කරන ලද ප්‍රකාශයන් ඇතුළත් ලේඛනයක් සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇත. එම ලේඛනයේ සඳහන් කරුණු සටහන් කර ගත් පුද්ගලයාද සාක්ෂියට කැඳවා ඇත. එවැනි තත්ත්වයක් යටතේ එම ලේඛනයේ ඇතුළත් සාක්ෂි සළකා බැලීම නිත්‍යානුකුල නොවන්නේ නැත. දැරියන් දෙදෙනාගේ මව සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඇයගේ ස්වාමිපුරුෂයා නැති වෙලාවට චූදිත නිලධාරියා වරින්වර ඇයගේ නිවසට පැමිණෙන නිසාත්, දරුවාට කිරි දෙමින් සිටින විටද එම ස්ථානයට පැමිණෙන නිසාත්, අභියාචක ඔවුන්ගේ නිවසට පැමිණීම සම්බන්ධයෙන් ඔවුන් අකමැති වූ බවයි.

වින්දිත දැරියන්ගේ පියා සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු පොලිස් නිලධාරීන් පිළිබඳව කිසිදු විශ්වාසයක් නොතැබුවත්, අභියාචක වෙත සහෝදරයෙකු සේ විශ්වාසයක් තබා තිබුණ බවයි. මෙම සිද්ධියෙන් අනතුරුව දරුවන් ආසිරි රෝහලට රැගෙන ගොස් පරීක්ෂා කළ බවටද ඔහු සාක්ෂි දෙමින් සඳහන් කර ඇත. මෙම සිද්ධිය වූ දින, එම අවස්ථාවේ දී එම නිවසේ සිටි එකම පිරිමි තැනැත්තා අභියාචක පමණි. ඒ අනුව ඉදිරිපත් වී ඇති පරිවේෂණීය සාක්ෂි මගින් තීරණය කළ හැකි වන්නේ, අභියාචක ඔහුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනාවන් හා සම්බන්ධ සිද්ධියට වගකිවයුතු බවයි. එවැනි තත්ත්වයක් යටතේ අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා වලින් ඔහු නිදහස් කිරීමට ගෙන ඇති තීරණය දෝෂ සහගත බව පෙනී යයි.

තවද මෙහිදී සඳහන් කළ යුතු වන්නේ, විධිමත් විනය පරීක්ෂණයේ දී අභියාචක විසින් කිසිදු පැහැදිලි කිරීමක්වත් කර නොමැති බවයි. පැමිණිල්ලේ සාක්ෂි අවසන් කරන බවට දැනුම්දීමෙන් අනතුරුව, චූදිත වෙනුවෙන් පෙනී සිටි රැකවරණ නිලධාරී ප්‍රකාශ කර ඇත්තේ, අභියාචක පරීක්ෂණ සභාව ඉදිරියේ ප්‍රකාශයක් හෝ සාක්ෂියක් ලබා දීමට අදහස් නොකරන බවයි. ඊට අමතරව ඔහු වෙනුවෙන් වෙනත් බාහිර සාක්ෂිකරුවෙකු හෝ නොකැඳවන බවටද ඔහු ප්‍රකාශ කර ඇත. අභියාචක මෙම සිද්ධිය ප්‍රතික්ෂේප කරන්නේ නම්, අඩුම වශයෙන් මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් හෝ කිරීමට ඔහුට අවකාශ තිබිණි. එම අවස්ථාව ඔහු විසින් පැහැර හැර ඇත. එයින් පෙනී යන්නේ, අභියාචකට එරෙහිව තිබූ සාක්ෂි ඔහු ප්‍රතික්ෂේප නොකරන බවට පූර්ව නිගමනයක් ඉදිරිපත් වන බවයි. ඒ බව සාක්ෂි ආඥා පනතේ 114 වගන්තියේ (ඊ) නිදර්ශනයේ සඳහන්ව ඇත. ඉදිරිපත් කළ හැකිව තිබූ සාක්ෂි එසේ ඉදිරිපත් නොකරනු ලැබුවහොත්, එසේ නොකරන තැනැත්තාට එම කරුණ අවැඩදායක විය හැකි බවට එකී නිදර්ශනයේ සඳහන් ව ඇත.

ඉහත කී හේතූන් සළකා බැලීමේ දී පෙනී යන්නේ, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් ගෙන ඇති තීරණය දෝෂ සහගත බවයි. එම තීරණය ප්‍රතික්ෂේප කරමින්, විනය බලධාරියා විසින් අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා දෙකටම, අභියාචක වරදකරු බවට පත් කිරීමට තීරණය කර ඇත. විනය බලධාරියා විසින් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 22:5, 22:7 වගන්තීන් යටතේ ඔහු

වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී විනය නියෝගය නිකුත් කර ඇති බව පෙනී යයි.

ඉදිරිපත් කර තිබූ චෝදනාවන් හී ඇති බරපතලකම සළකා බලා, අභියාචක වෙත පනවා ඇති දඬුවම ලිහිල් කිරීමට තරම් වන හේතූන් හෝ ඉදිරිපත් වී නොමැති බවටත් වැඩිදුරටත් තීරණය කරමු.

ඉහත දක්වා ඇති හේතූන් සළකා බලා, ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-